" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 | SLAB ACCREDITED | ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01 (A)-2019 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2019.11. 19

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභාව,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු/ මූල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.),

අධ්‍යක්ෂ, (අභ්‍යන්තර විගණන),

පරිපාලන නිලධාරී (පාලන),

ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරී,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2018, 01/2014 (VII), 31/2019, 22/99 (XXXVI), 01/2014(VIII) බස්නාහිර පළාතට අදාල කර ගැනීම</u>**

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ GOS/ADM/02/19/01/2019 හා 2019.11.14 දිනැති ලිපි මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2019 – (2019.09.30) | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම |
| 02 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 (VII) – (2019.10.03) | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |
| 03 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2019 – (2019.10.04) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/5 හා 2019.08.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුලත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම |

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මූල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640 Fax : 0112092636 dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532 Fax : 0112092533 dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501 Fax : 0112092505 dcs@eng.wpc.gov.lk | Tel : 0112092628 Fax : 0112092625 cia@cs.wpc.gov.lk |

| | | |
|---|---|---|
| 04 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/ 99(XXXVI) – (2019.10.10) | රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්. |
| 05 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/ 2014 (VIII) – (2019.10.17) | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |

02. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99(XXXVI)

මගේ අංකය: EST-6/05/TPR/1011
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්

2013.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXVII)න් සංශෝධිත 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 3:2(ආ) අනු ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී 3:2(ආ) අනු ඡේදය 2015.11.21 දින සිට බලාත්මක වන ලෙස පහත පරිදි සංශෝධනය කිරීමට 2019.06.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

3:2 (ආ) රාජ්‍ය පරිපාලන/ විදේශ කටයුතු/ භාණ්ඩාගාර චක්‍රලේඛ ඇතුලු සියලු සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රම අනුව අවසන් වරට තීරු බදු සහන සහිත වාහනයක් ආනයනය කිරීම සඳහා වන බලපත්‍රය ඉල්ලුම් කරන ලද අයදුම්පත්‍රය අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ දිනයේ සිට විශ්‍රාම ගන්නා දිනය වන විට වසර 05ක් ඉක්මවා නොමැති නිලධරයකු වීම.

03. ඒ අනුව බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ඉල්ලුම් කිරීම සඳහා භාවිත කළ යුතු 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXV) මගින් හඳුන්වා දී තිබූ අයදුම්පත්‍රය වෙනුවෙන් හඳුන්වා දෙන නව අයදුම්පත්‍රය “ඇමුණුම I” මගින් දැක්වේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ඇමුණුම I

**<u>විශ්‍රාම ලබන නිලධරයන් විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ</u>**

**<u>බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රය</u>**

**'අ' කොටස**

*වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා පමණයි*

බලපත්‍ර අංකය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| T | 45 | VE | | 002 | | |

---

**(අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.)**

**'ආ' කොටස**

01. (I) මුලකුරු සමඟ නම :- ……………………………………………………………………………………

(II) මුලකුරු වලින් හැඳින්වෙන නම් :- …………………………………………………………………………

……………………………………………………………………………………………………………………

**(ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කළ යුතුය)**

02. (I) උපන් දිනය:- වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(II) ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

03. (I) පෞද්ගලික ලිපිනය:- ……………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

(II) දුරකථන අංක :-

නිවස [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ජංගම [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

04. විශ්‍රාම ලබන දිනය :- වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

05. විශ්‍රාම ගනු ලබන්නේ :-

(I) වෛකල්පික විශ්‍රාම ගැනීම මත [ ]

(II) අනිවාර්ය විශ්‍රාම ගැනීම මත [ ]

(III) වෙනත් හේතූන් මත නම් එම හේතු සඳහන් කරන්න

……………………………………………………………………………………

06. විශ්‍රාම ලබන දිනට ලබමින් සිටි

(I) වැටුප් කේත අංකය :- ……………………………………………

(II) වැටුප් පරිමාණය :- රු. ……………………………………………

(III) වැටුප් පියවර :- රු. ……………………………………………

**'ඇ' කොටස**

**07. ඔබ සුදුසුකම් ලබන්නේ 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 2 වගන්තිය යටතේ නම්,**

(I) SL 1 - 2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් සහිත තනතුරකට පත් වූ

දිනය :- වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(II) තනතුරු නාමය :-..........................................................................................................

(III) එම තනතුරට පත්වූයේ:-

| | |
|---|---|
| ස්ථිරව | |
| වැඩ බැලීමේ පදනම මත | |
| රාජකාරි ඉටු කිරීමේ පදනම මත | |

(අදාළ කොටුවේ " √ " සලකුණ යොදන්න )

(IV) ඉහත සඳහන් චක්‍රලේඛයේ 2 වගන්තිය යටතේ ගැනෙන තනතුරුවල සේවා කාලය පිළිබඳ විස්තර :-

| **තනතුරු නාමය** | **සිට** | | | **දක්වා** | | | **තනතුරට පත් කර ඇත්තේ ස්ථිරව/ වැඩ බැලීම/ රාජකාරි ඉටු කිරීම සඳහා** | **සුදුසුකම් ලබන සේවා කාලය** |
|---|---|---|---|---|---|---|---|---|
| | **වර්ෂය** | **මාසය** | **දිනය** | **වර්ෂය** | **මාසය** | **දිනය** | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | **එකතුව (අවුරුදු)** | |

---

**'ඇ' කොටස**

**08.** ඔබ සුදුසුකම් ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **22/99 (XVIII)**න් ඇතුළත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **22/99හි 3:6** වගන්තිය යටතේ හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **22/99 (XXXI)**න් ඇතුළත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **22/99හි 3:7** වගන්තිය යටතේ නම්, **(අදාළ කොටුවේ "√" සළකුණ යොදන්න)**

(I) තනතුර:-

| | |
|---|---|
| රජයේ විශේෂඥ වෛද්‍ය | |
| රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය | |
| I වන ශ්‍රේණියේ රජයේ වෛද්‍ය | |
| I වන ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය | |
| විශේෂ ශ්‍රේණියේ රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය | |

(II) රජයේ වෛද්‍ය නිලධරයෙකු/දන්ත වෛද්‍ය/රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධරයෙකු ලෙස මුල් පත්වීම් දිනය:-

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(III) එකී තනතුරේ වසර 25ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය:- .........................................

(IV) ඔබ සුදුසුකම් ලබන්නේ රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස නම්,

(අ) රජයේ විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු/ රජයේ විශේෂඥ දන්ත වෛද්‍ය නිලධරයෙකු ලෙස උසස්වීම් ලද දිනය:-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(ආ) I ශ්‍රේණියේ රජයේ වෛද්‍ය නිලධරයෙකු/ I ශ්‍රේණියේ රජයේ දන්ත වෛද්‍ය නිලධරයෙකු/විශේෂ ශ්‍රේණියේ රජයේ ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධරයෙකු ලෙස උසස්වීම් ලද දිනය:-

වර්ෂය | | | | | මාසය | | දිනය | | |

(V) වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

.................... සිට ...................... දක්වා

.................... සිට ...................... දක්වා

---

**'ඉ' කොටස**

**09. ඔබ සුදුසුකම් ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXX)හි 4 වගන්තිය යටතේ නම්,**

(I) ඉහත චක්‍රලේඛයෙහි 4:1 හෝ 4:2 යටතේ ගැනෙන සේවයකට හෝ තනතුරකට පත් වූ දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(II) එම සේවය/ තනතුරේ වසර 25 ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කරන දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(III) SL 1-2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට පත් වූ දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(IV) එකී I ශ්‍රේණියේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(V) වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

.................... සිට ...................... දක්වා

.................... සිට ...................... දක්වා

---

**'ඊ' කොටස**

**10. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට පෙර අවසන් වරට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ හෝ වෙනත් චක්‍රලේඛයක් යටතේ බදු සහන සහිත වාහනයක් ආනයනය කර ඇත්නම් හෝ දේශීය වශයෙන් එකලස් කරන ලද වාහනයක් මිල දී ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-**

(I) අදාළ චක්‍රලේඛයේ අංකය :-…………………………………………………........................

(II) බලපත්‍ර අයදුම්පත්‍රය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ දිනය :-………………...……

(III) ණයවර ලිපි විවෘත කළ දිනය හෝ දේශිය වශයෙන් මිල දි ගනු ලැබු වාහනය සඳහා පළමු ගෙවීම සිදු කළ දිනය :- ………………………………………………….......................................

(IV) වාහනය ආනයනය කළ දිනය :- …………………………………………………..................

(V) වාහනය ලියාපදිංචි කළ දිනය :- …………………………………………...................

(VI) වාහනයේ ලියාපදිංචි අංකය :- ………………………………………………………......

**(මේ සමග ණයවර ලිපියේ /වාහනය ලියාපදිංචි කළ සහතිකයේ සහතික කළ පිටපතක් හෝ ඒ බව තහවුරු කෙරෙන වෙනත් ලිපි ඉදිරිපත් කළ යුතුය.)**

**11.** වාහන බලපත්‍රය ඉල්ලා සිටින්නේ මෙම චක්‍රලේඛයෙහි කුමන කාණ්ඩය යටතේ ද යන වග (පහත වගුවේ 3 වන තීරුවෙහි "√" සලකුණ යොදන්න.)

| නිලධර කාණ්ඩය | බදු සහනය | අයදුම්කරුට අදාළ කාණ්ඩය |
|---|---|---|
| I | රු. මිලියන 22 | |
| II | රු. මිලියන 16 | |
| III | රු. මිලියන 12 | |

**12.** **ඉල්ලුම්කරු මිය ගොස් ඇති විටෙක අදාළ බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන කලත්‍රයා පිළිබඳ විස්තර:-**

(I) සම්පූර්ණ නම:-..........................................................................................................

(II) ජාතික හැඳුනුම්පත් අංකය:-..........................................................................................

(III) ලිපිනය:-.....................................................................................................................

(IV) කලත්‍රයා බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් සඳහා මෙම චක්‍රලේඛයේ සුදුසුකම් ලබන වගන්තිය:-........................................................................................................................

**ඉල්ලුම්කරුගේ ප්‍රකාශය:-**

* රජයේ සේවයෙන් මා විශ්‍රාම ගිය/ රජයේ සේවයේ නියුතුව සිටි මාගේ කලත්‍රයා මිය ගිය දිනය වන ............................... දිනට පූර්වාසන්න වසර 05ක කාලය තුළ හෝ ඉන් මෙපිට රජයේ අනුග්‍රාහක පදනමක් මත වාහනයක් මා/ මගේ කලත්‍රයා විසින් ආනයනය කර නොමැති බව මෙයින් දන්වමි.

එසේම, මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම චක්‍රලේඛයෙහි කොන්දේසිවලට යටත්ව බලපත්‍රය ලබා ගැනීමට මම එකඟ වෙමි. ඉහත තොරතුරුවල වෙනසක් සිදු වුවහොත් නොපමාව ඒ බව දන්වා එවීමට පොරොන්දු වන අතර එම තොරතුරු අසත්‍ය වුවහොත් ගෙන්වා ගනු ලබන වාහනයට අදාළව ලබා දෙන ලද තීරුබදු සහන සියල්ල මාගෙන් ආපසු අයකර ගැනිමට කටයුතු කරන බව ද මම දනිමි.

දිනය:- .........................  ..............................................

අයදුම්කරුගේ අත්සන

**(* අනවශ්‍ය වචන කපාහරින්න)**

---

**'උ' කොටස**

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

**සටහන:**

අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියමිත පරිදි ජනාධිපති ලේකම්/ අමාත්‍යාංශ ලේකම්/ ප්‍රධාන ලේකම් වෙත මෙම නිර්දේශය ඉදිරිපත් කළ යුතුය. එසේම ඕනෑම ලේකම්වරයකු/ පළාත් ප්‍රධාන ලේකම්වරයකු මෙම ඉල්ලුම්කරුගේ ආසන්නතම ආයතන ප්‍රධානියා වන විට අදාළ ලේකම්වරයා විසින් පහත 'ඌ' හෝ 'එ' හෝ කොටසට අමතරව මෙම කොටසේ නිර්දේශය ද කළ යුතුය. එවැනි විටකදි ලේකම්වරයාට අමතරව පරිපාලන බලය පවරා ඇති ඊළඟ ප්‍රධානියාට ද මෙම නිර්දේශය කළ හැකිය.

මගේ අංකය:-………………………

**(*අනවශ්‍ය වචන කපා හරින්න)**
ලේකම්, ජනාධිපති කාර්යාලය*
ලේකම්, ………………………………………… අමාත්‍යාංශය*
ප්‍රධාන ලේකම්, .................................................පළාත් සභාව*
අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*/#
**(# ලේකම්වරයාම පෞද්ගලිකව මෙම නිර්දේශය කරන අවස්ථාවලදි පමණක් අ.ජ, වෙ.හා.ආ.ප්‍ර.දෙ වෙත මෙම නිර්දේශය කරන්න.)**

නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් නිලධරයා/ නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්තේ  වෛකල්පික/ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට පැමිණීමට පෙර නොවන බවත් හා විනය හේතුවක් මත නොවන බවත් විශ්‍රාම ගන්නා දිනයට පූර්වාසන්න වසර 05ක කාලය තුළ බදු සහන පදනම යටතේ වාහනයක් ආනයනය කර නොමැති බව සහතික කරන අතර, පහත සඳහන් ලියකියවිලිවල පිටපත් සහතික කර මේ සමග එවමි.

| පිළිවෙල | ලියකියවිලි වර්ගය | අදාළ වේ | අදාළ නොවේ |
|---|---|---|---|
| 1. | විශ්‍රාම ගැන්වීමේ ලිපිය | | |
| 2. | සේවා කාලය වසර 25ක් ඇති බව සනාථ කෙරෙන මුල් පත්වීමේ ලිපිය | | |
| 3. | සේවයේ/තනතුරේ I පන්තියට පත් කිරීමේ ලිපිය | | |
| 4. | අදාළ සේවයේ/ තනතුරේ වසර 03ක සක්‍රීය සේවා කාලය සනාථ කිරීමේ ලියවිලි | | |
| 5. | විශේෂඥ වෛද්‍යවරයෙක්/ විශේෂඥ දන්ත වෛද්‍යවරයෙක් ලෙස පත් කිරීමේ ලිපිය | | |
| 6. | භාණ්ඩාගාරය විසින්  තනතුර අනුමත ලිපිය | | |
| 7. | මියගිය නිලධරයෙකු වෙනුවෙන් නම් මරණ සහතිකය, විවාහ සහතිකය | | |
| 8. | වෛද්‍ය සහතික මත විශ්‍රාම ගන්වා ඇති නිලධරයෙක් නම් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාව | | |
| 9. | මීට පෙර ලබාගත් වාහන ආනයන බලපත්‍රයට අදාළව අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරන ලද අයදුම්පතෙහි පිටපත | | |
| 10. | මීට පෙර ලබා ගත් වාහනයට අදාළ ණයවර ලිපිය/ ලියාපදිංචි කළ සහතිකය | | |
| 11 | ජාතික හැඳුනුම්පතේ පිටපත | | |

මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

......................................................

දිනය ..............................  දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

## 'ඍ' කොටස

## ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

**(ඉල්ලුම්කරු පළාත් සභා නිලධරයෙකු වන විට පමණක් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය)**

මගේ අංකය:-……………………….

ලේකම්

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය*

***(අදාළ පරිදි සඳහන් කරන්න)**

මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට යටත්ව බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

..........................................................

දිනය .............................. ප්‍රධාන ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

---

## 'එ' කොටස

## අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

මගේ අංකය :-……………………….

අධ්‍යක්ෂ ජනරාල්

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා එහි සංශෝධිත විධිවිධාන යටතේ .................................... ..................................................................... මහතා/මෙය/මිය ට බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

..................................................

දිනය :- ....................................... අමාත්‍යාශ ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව